# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1599/13 - 2009 අප්‍රේල් 28 වැනි අඟහරුවාදා - 2009.04.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2006 අංක 10 දරන දේශීය ආදායම් පනත**

217 වැනි වගන්තිය යටතේ නිවේදනය

2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 217 වන වගන්තිය යටතේ [විශ්‍රාම වැටුප්, අර්ථ සාධක, පාරිතෝෂික හෝ ඉතුරුම් අරමුදල් සම්බන්ධයෙන් "කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුමත කරන ලද " යන අර්ථ දැක්වීමට අදාලව] මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් සහම්පති අංගම්මන වන මම 25 (1) (ඌ) වගන්තියේ කාර්ය සඳහා අනුමත කරන එකී යම් අර්ථ සාධක, පාරිතෝෂික, විශ්‍රාම වැටුප් හෝ ඉතිරි කිරීම් අරමුදලක් විසින්ම (දැනට අනුමැතිය දී ඇති අරමුදල් ද ඇතුලුව) පොදුවේ පිළිපැදීමට යටත් විය යුතු කොන්දේසි මෙම දැන්වීමෙහි සඳහන් උපලේඛනය මගින් නිශ්චිතව දක්වමි.

සහම්පති අංගම්මන,
දේශීය ආදායම් කොමසාරිස්.

2009 අප්‍රේල් මස 24 වැනි දින,
කොළඹ,
දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ දී ය.

උපලේඛනය

(1) ඕනෑම ගිණුම් වර්ෂයක් තුළ සේවා යෝජකයෙකු විසින් සියළුම අරමුදල් සඳහා ( එනම් සෑම අර්ථසාධක අරමුදලක්, ඉතිරි කිරීම් අරමුදලක්, විශ්‍රාම වැටුප් අරමුදලක්, භාරකාර අරමුදලක් හෝ පාරිතෝෂික අරමුදලක් වැනි ) ගෙවනු ලබන මුළු දායකමුදල, එම වර්ෂය සඳහා එකී සේවා යෝජකයාගේ මුළු වැටුප් බිලෙන් 25% නොඉක්මවිය යුතු ය.

(2) නිශ්චිත අයෝජනයක් සඳහා විශේෂ අනුමැතිය ලබාදී ඇත්නම් මිස එවැනි අරමුදලක් මගින් සිදු කරනු ලබන ආයෝජන, පහත සඳහන් සීමාවන් සමග අනුකූල විය යුතු ය.

(i) අවම වශයෙන් අරමුදලේ මුදල් වලින් 50%ක් ලංකා බැංකුව, මහජන බැංකුව, ජාතික ඉතිරි කිරීමේ බැංකුව හෝ රජයේ සුරැකුම් පත්වල තැන්පතු ස්වරූපයෙන් ආයෝජනය කර තිබිය යුතු ය.

(ii) ඉතිරි 50% අනෙකුත් වාණිජ බැංකුවල තැන්පතු ස්වරූපයෙන් ආයෝජනය කළ හැකි ය.

05-205

1A - G 011026—2,260 (2009/04) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.